සියලුම හිමිකම් ඇවිරිණි /All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ
## පළමු වාර පරීක්ෂණය - 2022
## 1st Term Test 2022 - August

| 9 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I | කාලය පැ. 2 යි. |
|---|---|---|

නම : ................................................................................. පන්තිය : .......................... විභාග අංකය : ..................

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

■ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

01. යුරෝපය හා ආසියාව භූගෝලීය වශයෙන් එක් භූමි ස්කන්ධයක් ලෙස පිහිටා ඇති අතර යුරෝපය සහ ආසියාව එක්ව සලකා එය .......................................... ලෙස හැඳින්වේ.
(යුරේෂියාව, ඉන්දු ඕස්ට්‍රේලියානු, දක්ෂිණ ආසියාව)

02. ආසියා මහාද්වීපයේ විශාලත්වය වර්ග කිලෝමීටර මිලියන.......................... පමණ වේ. (50.6, 45.6, 44.6)

03. ආසියාවේ සාමාන්‍ය ජන ඝණත්වය වර්ග කිලෝමීටරයට ............................ කි.(88, 87, 3000)

04. ස්වාධීන රටවල් ...................................... ක් ආසියානු ප්‍රදේශයේ පිහිටා ඇත. (54, 58, 45)

05. චීනයේ පමණක් භාවිත වන භාෂා ....................... ක් පමණ පවතී.

■ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් නි වටා ද වැරදි නම් වැ වටාද රවුමක් අඳින්න..

06. හිමාලය කඳු පන්තිය තුළ පිහිටි වඩාත් උස් කඳු ශිඛරයක් නොවනුයේ නන්දාදේවි කඳු ශිඛරයයි. (නි, වැ)

07. ටිබෙට් සානුව ලෝකයේ වඩාත් පහළින් ම පිහිටි සානුව වේ. (නි, වැ)

08. ටිබෙට් සානුව ලෝකයේ පියස්ස යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබයි. (නි, වැ)

09. බයිකල් විල ලෝකයේ ගැඹුරුතම කරදිය විල ලෙස සැළකේ. (නි, වැ)

10. උණුසුම් සෞම්‍ය දේශගුණය මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශයේ ව්‍යාප්ත වී පවතී. (නි, වැ)

■ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

11. ආසියාවේ ඉතා අඩු ම උෂ්ණත්වයක් වාර්තා වන ................................................ නගරය යි.

12. චීනය හරහා ගලා බසින හොවැංහෝ ගංගා නිම්නයේ ........................... නගරය මුල් කොට ගත් දියුණු නාගරික ශිෂ්ටාචාරයක් බිහි විය.

13. ආසියාවේ කාෂිකාර්මික ආර්ථිකයක් පවතින රටක් ලෙස ............................................... හඳුන්වයි.

14. ආසියාවේ වර්තමාන ජන සංඛ්‍යාව මිලියන .................................. ක් පමණ වෙයි.

15. මොහෙන්දජාරෝ සහ හරප්පා යන ඉපැරණි නගර දෙක ............................................... ගංගාව මූලික කරගනිමින් දියුණු වූ නාගරික ශිෂ්ටාචාරයක් වේ.

■ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරෙහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

16. කොකසයිඩ් මානව වර්ගය ජීවත් නොවන රටක් වනුයේ,

1. ඉන්දියාව 2. ශ්‍රී ලංකාව 3. අරාබි ය. 4. මලයාසියාව.

(.................)

17. කාරිෆ් වගා කන්නය තුළ වගා කරන බෝගය වන්නේ,

1. කපු 2. වී 3. බාර්ලි 4. උක්

(.................)

18. රාබි වගා කන්නය තුළ වගා කරන බෝගයක් වන්නේ,

1. ඕට්ස් 2. වේස් 3. මිලට් 4. කපු

(.................)

18. ඩුබායි ආර්ථිකයේ පදනම වනුයේ,

1. ඇඟලුම් 2. සේවා කර්මාන්තය 3. පෙට්‍රෝලියම් 4. කෘෂි කර්මාන්තය

(.................)

19. ජපානයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් කර්මාන්ත අංශය හිමි කර ගෙන ඇති ප්‍රතිශතය වන්නේ,

1. 52.7% 2. 27.2% 3. 72.2% 4. 22.7%

(.................)

20. ආක්ටික් සාගරයට ගලා නොබසින ගංගාව වන්නේ,

1. ඕබි 2. යෙනිසි 3. ලීනා 4. යැංසි

(.................)

(2 x 20 = 40)

## II කොටස

- **මෙම කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හැර තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

01. අ. සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් ලක්ෂණ ලකුණු කර නම් කරන්න.

i. හිමාලය කඳු පන්තිය ii. ගංගා නම් ගඟ

iii. ජපානය iv. කැස්පියන් මුහුද v. ඩුබායි

ආ. සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ලක්ෂණ ලකුණු කර නම් කරන්න. (2 x 5 = 10)

i. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ii. පේදුරු තුඩුව

iii. නොරොච්චෝලේ iv. හම්බන්තොට v. ඩෙල්ෆ් දූපත

(2 x 5 = 10)

02. i. ආසියානු මහාද්වීපයට උතුරින් හා දකුණින් පිහිටි මහාද්වීප දෙක නම් කරන්න. (ල. 2)

ii. ආසියානු ප්‍රදේශයට අයත් ප්‍රධාන දූපත් රාජ්‍යයන් තුනක් නම් කරන්න. (ල. 3)

iii. ආසියානු කලාපයේ දැකිය හැකි සුවිශේෂී භෞතික ලක්ෂණ 3 ක් දක්වා ඉන් එක් ලක්ෂණයක් පැහැදිලි කරන්න. (ල. 5)

03. i. ආසියානු මහාද්වීපයේ පවතින ප්‍රධාන කඳුවැටියක් හා සානුවක් නම් කරන්න (ල. 2)

ii. ආසියාවේ වැඩිම ජනගහනයක් ඇති රටවල් තුනක් නම් කරන්න. (ල. 3)

iii. ආසියාවේ පිහිටි ජන අධික නගර තුනක් නම් කර, එම නගර ආශ්‍රිත ජනගහනය වැඩි වීමට හේතුවක් පැහැදිලි කරන්න. (ල. 5)

04. i. ආසියාවේ පිහිටි කාර්මික ආර්ථිකයක් පවතින රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ආසියාවේ පිහිටි කෘෂිකාර්මික ආර්ථිකයක් පවතින රටවල් දෙකක් හා සේවා කර්මාන්තයට ප්‍රසිද්ධ රටවල් එකක් නම් කරන්න. (ල. 3)

iii. ජපානයේ දක්නට ලැබෙන නිෂ්පාදන කර්මාන්ත තුනක් නම් කර ජපානයේ නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනයට හේතු පැහැදිලි කරන්න. (ල. 5)

05. i. කොකොසයිඩ් නම් මානව වර්ගයා දක්නට ලැබෙන ආසියානු රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

ii. මොංගලොයිඩ් ජන වර්ගය ව්‍යාප්ත වූ ප්‍රධාන ආසියානු රටවල් 3 ක් නම් කරන්න. (ල. 3)

iii. ආසියානු කලාපයේ ජන සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම තුළ මතු වී තිබෙන ගැටලු 3 ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

05. i. ආසියානු කලාපය තුළ පිහිටි විශාල විල් දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ආසියානු කලාපයේ පිහිටි ලෝකයේ විශාල සානු 3 ක් නම් කරන්න. (ල. 3)

iii. ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප 3 නම් කර ඉන් එක් දේශගුණික වර්ගයක් සැකෙවින් පැහැදිලි කරන්න. (ල. 5)

06. i. ආසියාවේ ඉතාම අඩු උෂ්ණත්වයක් වාර්තා කරන නගරය හා ඉහළ උෂ්ණත්වයක් වාර්තා කරන නගරය පිහිටි රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ල. 2)

ii. නිවර්තන දේශගුණික කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන දේශගුණ වර්ග 3 ක් නම් කරන්න (ල. 3)

iii. වර්ෂාපතනය හා උෂ්ණත්වය වෙනස්කම් අනුව ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන වනාන්තර 3 ක් නම් කර ඉන් එක් වනාන්තරයක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)